රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 06/2025


මගේ අංකය : EST-1/CIRL/03/0001
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.


2025.10.16

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>රාජ්‍ය ආයතන සහ රාජ්‍ය නිලධරයන් විසින් නීතිපති උපදෙස් හෝ අදහස් ලබා ගැනීම</u>**

ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ XXXIII වැනි පරිච්ඡේදය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. ඒ අනුව උක්ත පරිච්ඡේදයේ 1:1 උපවගන්තියෙහි දක්වා ඇති විධිවිධාන අනුව නීතිපතිගේ උපදෙස් හෝ අදහස් ඉල්ලා සිටින විට එසේ උපදෙස් හෝ අදහස් ඉල්ලා සිටින්නේ කුමන කාරණාවක් පිළිබඳව ද යන බව පැහැදිළිව සඳහන් කළ යුතු බවත්, අදාළ කාරණය පිළිබඳ සම්පූර්ණ විස්තර අඩංගු සිද්ධි ප්‍රකාශයක් ද ඔහු වෙත යැවිය යුතු බවත්, ඒ සමඟ කාර්යාලයීය ලිපිගොනුවක් ඉදිරිපත් කරන්නේ නම් එහි අදාළ පිටුවල යොමු විස්තර ද සඳහන් කළ යුතු බවත් දක්වා ඇත. එමෙන්ම එම පරිච්ඡේදයේ 1:2 උපවගන්තියෙන් කල්පිත කරුණු ගැන උපදෙස් දෙන ලෙස නීතිපතිගෙන් ඉල්ලා නොසිටිය යුතු බව ද දක්වා ඇත.

03. රාජ්‍ය ආයතනයක් හෝ රාජ්‍ය නිලධරයකු විසින් නීතිපතිගේ උපදෙස් හෝ අදහස් විමසීමේ දී අනුගමනය කළ යුතු විධිවිධාන XXXIII වැනි පරිච්ඡේදයේ දක්වා ඇතත්, ඉන් බැහැරව උපදෙස් සහ අදහස් විමසන බවත්, පූර්වයෙන් උපදෙස් ලබා දී ඇති කරුණු පිළිබඳ නැවත නැවත විමසන බවත් නීතිපති විසින් නිරීක්ෂණය කර ඇති බව දන්වා ඇත.

04. එම නිසා නීතිපති වෙතින් උපදෙස් හෝ අදහස් ඉල්ලා සිටීමේ දී, ආයතන සංග්‍රහයේ XXXIII වැනි පරිච්ඡේදයේ විධිවිධාන අනුවම කටයුතු කළ යුතු බව අවධාරණය කරමි.


එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන
අමාත්‍යාංශය

දුරකථන : 0112662340
ෆැක්ස් : 0112692158
විද්‍යුත් ලිපිනය : ade-i@pubad.gov.lk